# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2232/6 - 2021 ජුනි මස 14 වැනි සඳුදා - 2021.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

5 වන හා 10 වන වගන්ති, පළමුවන උපලේඛනය සහ තුන්වන උපලේඛනය යටතේ වන නිවේදනය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තියේ 3 වන උපවගන්තියේ (ඊ) ඡේදය, 10 වන වගන්තියේ 1 වන උපවගන්තියේ (ආ) ඡේදයේ (v) වන උපඡේදය, පළමුවන උපලේඛණයේ 8 වන ඡේදය සහ තුන්වන උපලේඛනයේ(ඇ) ඡේදයේ (ii) වන උපඡේදය යටත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම වැටුප්,අර්ථසාධක,පාරිතෝෂික හෝ ඉතුරුම් අරමුදලක් හෝ ඉතුරුම් සමාජයක් සම්බන්ධයෙන් මා පැවරි ඇති බලතල ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හේරත් මුදියන්සේලාගේ විජය චන්ද්‍රතිලක බණ්ඩාර වන මම මෙම නිවේදනය මගින් ඉහත වගන්ති හා උපලේඛනවල කාර්යය සඳහා අනුමත කරන යම් විශ්‍රාම වැටුප්,අර්ථසාධක,පාරිතෝෂික හෝ ඉතුරුම් අරමුදලක් හෝ ඉතුරුම් සමාජයක් විසින් පොදුවේ පිළිපැදීමට යටත් විය යුතු කොන්දේසි මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වමි.

උපලේඛනය

(1) ඕනෑම ගිණුම් වර්ෂක් තුළ සේවා යෝජකයකු විසින් සේවාන්ත ප්‍රතිලාභ සඳහා වූ සියළුම අරමුදල් සඳහා (ඕනෑම විශ්‍රාම වැටුප්,අර්ථසාධක, භාරකාර, පාරිතෝෂික හෝ ඉතුරුම් අරමුදලක් හෝ ඉතුරුම් සමාජයක්) 1958 අංක 15 දරණ පනත යටතේ ස්ථාපිත සේවක අර්ථසාධක අරමුදලට (සේ.අ.අ.) සහ 1980 අංක 46 දරණ පනත යටතේ ස්ථාපිත සේවා නියුක්ති භාරකාර අරමුදලට (සේ.නි.භා.අ.) ගෙවනු ලබන දායක මුදල් ද ඇතුළුව ගෙවනු ලබන මුළු දායක මුදල්, ඒකී සේවා යෝජකයාගේ මුළු වැටුප් බිලෙන් 25% නොඉක්ම විය යුතුය.

(2) නිශ්චිත ආයෝජනයක් සඳහා විශේෂ අනුමැතියක් ලබා දී ඇත්නම් මිස, එවැනි අරමුදලක් මගින් කර ඇති ආයෝජන පහත සඳහන් සීමාවන් සමඟ අනුකූල විය යුතුයි: -

(i) අවම වශයෙන් අරමුදලේ මුදල්වලින් 40% ක් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව,ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හෝ රජයේ සුරකුම්පත්වල තැන්පතු වශයෙන් ආයෝජනය කළ යුතුය(ආයෝජනය වසර පුරාම පැවතිය යුතුය) ;

(ii) ශේෂයක් වේ නම් පහත පරිදි ආයෝජනය කළ හැක,

අ. අරමුදලේ මුදල්වලින් 20% කට වැඩි නොවන පරිදි ලැයිස්තුගත ණයකරවල හෝ ලැයිස්තුගත ස්කන්ධවල ආයෝජනය කළ හැක ;

ආ. ඉතිරි ශේෂය තැන්පතු වශයෙන් වෙනත් වාණිජ බැංකුවල ආයෝජනය කළ හැක.

(3) මෙම නිවේදනයේ "මුළු වැටුප් බිල්පත" යන්නෙන් සේවා නියුක්තිකයන්ට ගෙවනු ලබන, සේවාන්ත ප්‍රතිලාභ සඳහා වන අරමුදල්වලට දායක කර ගන්නා වූ මුළු ප්‍රතිලාභ අදහස් වන අතර එයට වර්ෂයේ ලාභය ගණනය කිරීමේ දී ලාභ හෝ අලාභ ප්‍රකාශනයට අය කරනු ලබන සේවාන්ත ප්‍රතිලාභවලට අදාළ යම් ගෙවීමක් හෝ දායක මුදලක් හෝ ප්‍රතිපාදනයක් ඇතුලත් වේ.

එසේවුවද, උපලේඛනයේ 1 හා 2 ඡේදවල නිශ්චිත කර ඇති කොන්දේසි නොසලකා, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සියළුම කාර්යයන් සඳහා සේ.අ.අ. හා සේ.නි.භා.අ. කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද සේවාන්ත ප්‍රතිලාභ සඳහා වූ අරමුදල් ලෙස සැලකේ.

හේරත් මුදියන්සේලාගේ විජය චන්ද්‍රතිලක බණ්ඩාර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02,

06- 283

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.